**මොණරාගල ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 වැනි දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**---------**

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ගිනි නිවන රථ 02ක හා අත් ට්‍රැක්ටරයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බෝහිටිය කණිටු විදුහලට ජලය ලබාදීම සඳහා වූ කර්මාන්තයට ගෙවන ලද රු.20,000ක අත්තිකාරම් මුදල වැය ගිණුමට හර කර තිබුණි. පසුව කර්මාන්තය සඳහා මුදල් ගෙවීමේදී රු.86,912 ක වටිනාකමින් එම ප්‍රමාණය අඩු නොකර වැය ගිණුමට හර කර ගිණුම්ගත කිරීම නිසා වියදම රු.20,000කින් වැඩිපුර ගිණුම්ගත වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව කර්මාන්ත සඳහා ගෙවිය යුතු රු.903,442ක වියදම් වෙනුවෙන් ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

**------------------------**

ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේඑකතුව රු.29,123,324 ක් වූ අතර ශේෂ සහතික හා උපයෝගී ලේඛන අනුව ශේෂය රු.28,853,900 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------**

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබූ සභාවට අයවිය යුතු රු.5,965,164ක මුදලක් අය වී නොතිබුණි.

(ආ) 1989 හා 1990 යන වර්ෂ තුල නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිකර සභාවට ලබාදී තිබූ කඩකාමර වෙනුවෙන් ගෙවිය යුතු රු.4,872,912 ක මුදලක් ණය හිමියන් යටතේ ප්‍රතිපාදනය කර තිබුණද එය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**---------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11, 225,457 ක වත්කම් විෂයන් 04 ක්, රු.458,402 ක වගකීම් විෂයක් හා රු.62,494ක ආදායම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**------------------------------------------------**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **<u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u>** | **<u>අනුකූල නොවීම</u>** |
|---|---|
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| i. 152 වගන්තිය | විවිධ සමාගම් විසින් 2005 සිට 2012 වර්ෂය දක්වා ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 12කින් වාර්ෂික බද්දක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| ii. 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.50,626,951 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) **<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>** | |
| (i). 387 | මහජන බැංකුවේ අංක 068-100136752849 දරන ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂය අවසානයට රු.170,553 ක අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. |
| (ii). 571 (3) | රු. 5,170,526 ක කල් ඉකුත් වූ තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii).880 | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------------**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,547,733 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 98,725 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **බදු කුලී**

---------

සමාලෝචිත වර්ෂය සඳහා අංක 24 දරන ගවමස් කඩය බදු දීමෙන් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ලැබිය යුතු රු.165,955 ක්ද, හිඟ බදුකුලී රු.1,174,566 ක්ද හා ප්‍රමාද ගාස්තු රු.2,992,961 ක්ද ඇතුලුව රු.4,333,482 ක මුදලක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **වෙනත් ආදායම්**

----------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයක් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන හෝටල්/ ලැගුම්හල් තුනකින් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය බාහිර පුද්ගලයන් දහ දෙනෙකු වෙත කුලී පදනම මත ලබා දීම වෙනුවෙන් අයවිය යුතු රු.423,153 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,427,355 |
| මුද්දර ගාස්තු | 3,002,926 |

2.3 **අධිභාර**

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුලදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.922,195 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

(අ) 2009 දෙසැම්බර් 22 වන දින ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර අංක 2201 යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගෙන තිබූ රු.12,985,982ක ණය මුදලින් පසුගිය වර්ෂයේ අවසාන කාර්තුවට හා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.2,478,853ක ණය වාරික ගෙවා නොතිබූ අතර ඒ වෙනුවෙන් සභාවට රු.81,802ක අමතර පොලියක් ගෙවීමට සිදුව තිබුණි.

(ආ) දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින වාහන 03 ක් සමලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අපහරණය කිරීමට කටයුතු කිරීමකින් තොරව කාර්යාල භූමියේ විවිධ කාලගුණික බලපෑම් වලට හසුවෙමින් තිබුණි.

2.5 අක්‍රිය ගිණුම්

----------------

මහජන බැංකුවේ පවත්වා තිබූ අංක 176752844 දරන බැංකු ගිණුම 2010 දෙසැම්බර් 01 දින සිට අක්‍රීය තත්වයේ පැවැති අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.31,075ක ශේෂයක් පැවැතිණි.

2.6 **අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්,වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය